# දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව.

## ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## අම්පාර.

දිස්ත්‍රික්කය :- අම්පාර **2019.12.10**

01. පිළිගැනීමේ කථාව :-

2019 වර්ෂයේ පවත්වනු ලබන ප්‍රථම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම ආරම්භ කරමින් අම්පාර දිස්ත්‍රික් ලේකම් ඩී.එම්.එල්. බණ්ඩාරනායක මහතා විසින් කළ ඉල්ලීම අනුව, මුලින්ම පසුගිය අප්‍රේල් 21 වන පාස්කු ඉරිදා දින රටේ සිදු වූ ඛේදජනක සිදුවීම හේතුවෙන් මියගිය කතෝලික පුරවැසියන් වෙනුවෙන්ද 2004 වර්ෂයේ දෙසැම්බර් මස 26 වන දින ඛේදවාචකයෙන් ජාතික වශයෙන් හා විශේෂයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ සිදු වූ මිනිස් ජීවිත හානි වීම වෙනුවෙන් හා රටේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් වෙනුවෙන් විනාඩි දෙකක නිහඬතාවයක් ආරක්ෂා කරමින් ඔවුන් සිහිකරන ලදි. අනතුරුව කමිටුවට සහභාගී වී සිටි අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු නව ගරු සභාපති, දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීණී ශ්‍රියානි විජේවික්‍රම මැතිනිය , ගරු වනජීවී රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මැතිතුමන්, දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී දයා ගමගේ මැතිතුමන්, දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසල් කාසිම් මැතිතුමන්, දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කේ. කෝඩීස්වරන් මැතිතුමන්, දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ.එල්.එම් නසීර් මැතිතුමන්, දිගාමඩුලු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය එස්.එම්.එම්.ඉස්මයිල් මැතිතුමන් හා මැති ඇමතිතුමන්ලාගේ සම්බන්ධීකරණ නිලධාරීන්, මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවල නගරාධිපතිතුමන්ලා හා සභාපතිපතිතුමන්ලාද, ප්‍රාදේශීය ලේකම්වරුන්ද, පළාත් සභාවේ සියළු දෙපාර්තමේන්තු ප්‍රධානින්ද දිස්ත්‍රික්කයේ සියළු දෙපාර්තමේන්තු ප්‍රධානින්ද, නියෝජ්‍ය පොලිස්පතිතුමන්, යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, විශේෂ කාර්ය බලකාය නියෝජනය කරමින් පැමිණ සිටි ත්‍රිවිධ හමුදා නිලධාරීන්ද, සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන්ද, මාධ්‍යවේදීන්ද ඇතුළුව සහභාගී වී සිටි සියළු දෙනා ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදි.

දිසාපති තුමන් විසින් වැඩිදුරටත් අදහස් දක්වමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම මාස කිහිපයක් පැවැත්වීමට නොහැකිවීම සම්බන්ධයෙන් කනගාටුව ප්‍රකාශ කරන ලදි. පසුව 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් ඉතා සාර්ථක ලෙසින් නිම කිරීමට සහයෝගය දැක්වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් ට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ට හා සහයෝගය ලබාදුන් අනෙකුත් ආයතනවල නිලධාරීන්ට ස්තුතිය ප්‍රකාශ කරන ලද අතර අනතුරුව දිසාපතිතුමන් විසින් සභාවේ ඉදිරි කටයුතු සිදුකරගෙන යාමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අභිනව සභාපතිතුමියට සුභපතමින් මූලාසන කටයුතු මෙහෙයවීමට ආරාධනා කරන ලදී.

02. නව සභාපතිතුමියගේ කථාව.

### 2.1 <u>දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනී ගරු පාර්ලිමේන්තු ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය</u>

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු වනජීවී රාජ්‍ය අමාත්‍ය විමලවීර මැතිතුමන්ට සුබ පැතුම් එක්කරමින් එතුමන් ඇතුළු සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පළාත් පාලන ආයතන වල නගරාධිපතිතුමන්ලා හා සභාපති තුමන්ලා හා දිසාපතිතුමන් ඇතුළු සියළුම රජයේ නිළධාරීන්, එතුමිය විසින්ද පිළිගන්නා ලදි.

අනතුරුව තමන් අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති වශයෙන් පත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ට එතුමිය විශේෂ ස්තුතිය ප්‍රකාශ කරන ලද අතර මෙම භාරදූර කාර්යය භාරය ඉටු කිරීමට සියලුම ආයතන වල සහයෝගය කාර්යක්ෂමව හා ගුණාත්මකව ලබා දීමට කටයුතු කරන මෙන් වැඩි දුරටත් ඉල්ලා සිටින

ලදි. එසේම,වගකිවයුතු නිලධාරීන් අනිවාර්යයෙන් මෙම කමිටුව සඳහා සහභාගී විය යුතු බවත් අවශ්‍ය අදාළ තොරතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත කඩිනමින් ලබා දීමට කටයුතු සිදුකළ යුතු බවත් මෙහිදී අවධාරණය කරන ලදි. එමෙන්ම මාස ගණනාවකින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමක් නොපැවැත්වූ බැවින් සහ පවතින ආපදා තත්ත්වය හේතුවෙන් කඩිනමින් රැස්වීම කැඳවූ බවත්, නව වසරේ කටයුතු සංවිධානය කර ගැනීමටත් මෙය අවස්ථාවක් කරගන්නා බව ගරු සභාපතිතුමිය විසින් ප්‍රකාශ කරන ලදි.

03. ඉන් අනතුරුව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසල් කාසිම් මැතිතුමා විසින් අදහස් දක්වමින් දිස්ත්‍රික්කයේ පවතින ගැටළු පැය 2 2/1 වැනි කාලයක් තුළදී සාකච්ඡා කර නිම කිරීමට නොහැකි බවත් දිවා ආහාර වේලක් ලබා දී සම්පූර්ණ දවසම මේ සඳහා යොදා ගැනීමට කටයුතු කරන මෙන් යෝජනා කරන ලදි. ඊට පිළිතුරු වශයෙන් ගරු සභාපතිතුමිය එකඟත්වය ප්‍රකාශ කළ අතර මසකට වරක් කමිටුව පැවැත්වීමට කටයුතු කරන්නේ නම් හා ප්‍රාදේශීය මට්ටමේ ගැටළු දිස්ත්‍රික් කමිටුවට නොගෙන විසඳා ගැනීමට උපරිමයෙන් ක්‍රියාත්මක වන්නේ නම් කමිටුවේ කටයුතු කල්වේලා ඇතිව නිම කළ හැකි බව අවධාරණය කළාය.

04. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී දයා ගමගේ මැතිතුමන් විසින් නව රජයේ අතිගරු ජනාධිපතිතුමන්ටත් ගරු අග්‍රාමාත්‍යතුමන්ටත් සුබ පැතුම් එක්කරන බවත් අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු නව සභාතිතුමියට හා වනජීවී රාජ්‍ය අමාත්‍ය තුමන්ටත් හදපිරි සුබ පැතුම් එක්කරන බවත් එතුමන් විසින් කමිටුවට ප්‍රකාශ කරන ලදි. එසේම 2019 වසර තුළ රු. මිලියන 3172 ක් වටිනා ව්‍යාපෘති 3934 ක් දිස්ත්‍රික්කය තුළ සාර්ථකව ක්‍රියාත්ම කිරීම සඳහා සහයෝගය දැක්වූ දිස්ත්‍රික් ලේකම්තුමන්, ප්‍රාදේශීය ලේකම්වරුන් හා අනෙකුත් නිලධාරීන්ට ස්තූතිය ප්‍රකාශ කරන ලදි.

05. අනතුරුව 2018.09.13 දින පැවැති අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ වාර්තාව ඒකමතිකව අනුමත කරන ලදි.

06. **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රාදේශීය මට්ටමින් විසඳා නොමැති ගැටළු.**

| # | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | විෂය | වගකීම් දරණනිලධාරීන්/ ආයතනය |
|---|---|---|---|
| 01 | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | **i. දැනට පවතින වැසි සහිත කාලගුණික තත්ත්වය හේතුවෙන් අවතැන් වූවන් සඳහා කඩිනමින් සහන සැලසීමට පියවර ගැනීම.**<br>**(ගරු. දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය එස්.එම්.එම්.ඉස්මයිල්)**<br><br>දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය මගින් දැනට සිදු කරන සහන පිළබඳව ඉදිරිපත් කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ ,දිස්ත්‍රික් ආපදා කළමණාකරණ ඒකකය, |
| | | **ii. ඉදිරියේ දී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග දිස්ත්‍රික් මට්ටමින් සකස් කිරීම.**<br>**(ගරු. දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය එස්.එම්.එම්.ඉස්මයිල්)**<br>කාණු පද්ධතිය ක්‍රමාණකූලව සකස් කිරීමට කටයුතු සම්පාදනය කළයුතු බව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසල් කාසිම් මැතිතුමන් පෙන්වා දෙන ලදි.<br>ගරු සභාපතිතුමිය විසින් ආපදාකළමණාකරණ ඒකකය හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම එක්ව මේ සඳහා සැලැස්මක් සකස් කරන ලෙස දැන්විය. දැනට ආපදාවට පත් ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම්/ආපදාකළමනාකරණ ඒකකය/ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම/නාගරික සංවර්ධන අධිකාරිය/වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමග එක්ව | සහකාර අධ්‍යක්ෂ ,දිස්ත්‍රික් ආපදා කළමණාකරණ ඒකකය,සහකාර අධ්‍යක්ෂ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම |

| | | | |
|---|---|---|---|
| | | කමිටුවක් පත් කර ගන්නා ලෙසට දැනුවත් විය.<br>අනතුරුව මසක් ඇතුළත මෙම කමිටුව මගින් අදාළ සැලැස්ම සකස් කර එළඹෙන කමිටු වාරයට ඉදිරිපත් කරන ලෙස ට තීරණය විය. | |
| | | **iii. ගංවතුරින් හානි වූ කුඹුරු සඳහා නැවත වගා කිරීමට අවශ්‍ය අස්වනු නෙලීමේ කාලය අඩු බීජ ලබා දීම හා අලාභ ලබා දීමට කටයුතු කිරීම.**<br>**(ගරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)**<br><br>ගොවීන්ට තාක්ෂණික දැනුම ලබා දිය යුතු බව දයාගමගේ මැතිතුමා පෙන්වා දෙන ලදි. අලාභ වන්දි ලබා ලබා ගැනීමට අමාත්‍යාංශ දැනුවත් කරන මෙන් සභාපති තුමිය දන්වා සිටින ලදි. එසේම වගා හානි පිළිබඳ තක්සේරු වාර්තාවක් සකස් කරන ලෙස කමිටුව විසින් දන්වා සිටින ලදි. දින 75 වී සොයා ගැනීමටත් විකල්පයක් වශයෙන් කෙටි කාලීන බෝග වගා කිරීමටත් කටයුතු සලස්වන ලෙසත් දැනුවත් කරන ලදි. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්, ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය, අම්පාර |
| 01 | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | **iv. අවතැන් වූවන් හා ජීවනෝපාය අහිමි වූ අය සඳහා සහන ලබා දීම.**<br>**(ගරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)**<br>දිස්ත්‍රික් ආපදා කළමනාකරන සහකාර අධ්‍යක්ෂ විසින් ඊට අදාළව ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදි.<br>**v. ගංවතුර ආපදාවෙන් හානියට පත් වූ ප්‍රදේශවල කාණු පද්ධති නොමැති ස්ථානවටල කාණු පද්ධති ඉදිකිරීම ඉදිරි සංවර්ධන වැඩසටහන් මගින් ප්‍රමුඛතාවය ලබා දීම.**<br>**(ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පාරලිමේන්තු මන්ත්‍රී කේ.කෝඩීස්වරන් මැතිතුමා)**<br><br>ඉහත 11 ප්‍රශ්නයට අදාළ පිළිතුර හා සැසදේ. | සහකාර අධ්‍යක්ෂ ,දිස්ත්‍රික් ආපදා කළමණාකරණ ඒකකය, |
| | | **vi. අධ්‍යාපනය හා සෞඛ්‍යය යන අංශ වෙත වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් මේ වන විට නවතා ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අනුමත කර ගැනීම**<br><br>මේ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම් |
| | | **vii. 2019 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අනුමත වී මේ වන විට ඉදි කිරීම් කටයුතු නවතා ඇති ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කර ගැනීම.**<br>(ගරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය<br><br>මේ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම් |
| | | **viii. අම්පාර දිස්ත්‍රික්කයේ සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ කි .මී.600 කට ආසන්න පානීය ජලනල මාර්ග දීර්ඝ කිරීම.**<br>**( ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. දයා ගමගේ මැතිතුමා)**<br><br>මේ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, අම්පාර |
| | | **ix. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ආරම්භ කළ නිවාස ව්‍යාපෘති 111 වැඩ කටයුතු අවසන් කිරීම**<br>**( ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. දයා ගමගේ මැතිතුමා)**<br><br>මේ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදි. ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. දයා ගමගේ මැතිතුමා විසින් නිවාස ණය වාරිකය අඩක් අඩු කිරීමට යෝජනා කරන ලදි | දිස්ත්‍රික් කළමණාකරු, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අම්පාර |

| | | | |
|---|---|---|---|
| 01 | සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස | **x.** අයිරෝඩ් ව්‍යාපෘතිය යටතේ අම්පාර දිස්ත්‍රික්කය පුරා කි.මී. 400කට ආසන්න ප්‍රමාණයක් ග්‍රාමීය අතුරු මාර්ග ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගය ඇතුව මීට මාස කිහිපයකට පෙර කාපට් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා දේශපාලන අධිකාරිය සහයෝගය ලබා දීම. ( ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. දයා ගමගේ මැතිතුමා)<br>අයිරෝඩ් ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති අධ්‍යක්ෂක ඊලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට කැඳවන ලෙස තීරණය විය. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය, අම්පාර |
| | | **xi.** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් කරගෙන ආ ග්‍රාමීය යකඩ පාලම් ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට ඇති පාලම් ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකිරීම. ( ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. දයා ගමගේ මැතිතුමා)<br>අනුමත ව්‍යාපෘති කෙසේ හෝ අම්පාර දිස්ත්‍රික්කයට ලබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස සභාපති තුමිය හා වනජීවී රාජ්‍ය අමාත්‍යතුමාගෙන් කමිටු සාමාජිකයින් ඉල්ලීමක් කරන ලදී. | සහකාර පළාත් පාලන කොමසාරිස්, අම්පාර |
| | | **xii.** ජාතික තරුණ සේවා සභාව මගින් ආරම්භ කිරීමට බලාපොරොත්තුවන වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීම. (ගරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)<br>අම්පාර පොතුවිල් සුළු ධීවර සමිති ගොඩනැගිල්ල ලබා දීමට කටයුතු කරන ලෙසට ඉල්ලීමක් කරන ලෙසට දැනුවත් විය. දෙහිඅත්තකණ්ඩිය තරුණසේවා සභා ඉඩම පවරා දෙන ලෙසට මහවැලි අධිකාරියට දන්වන ලෙස දැනුවත් කරන ලදී. | සහකාර අධ්‍යක්ෂ, ජාතික තරුණ සේවා සභාව, අම්පාර |
| 02 | ලාහුගල | **i.** පානම ප්‍රදේශය සඳහා පානීය ජලය ලබා දීම. (ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)<br>අමාත්‍යාංශය සමග සාකච්ඡා කර තීරණයක් ගන්නා බව කමිටුව දැනුවත් කරන ලදී. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, අම්පාර |
| | | **ii.** පානම මීයන්ගොඩ යාය වී වගා කිරීම සඳහා අවසර ලබා දීම. (ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)<br>ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීමට තීරණය විය | සහකාර අධ්‍යක්ෂ, වනජීවී දෙපාර්තමේන්තුව, අම්පාර / දිසාවන නිලධාරී, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව, අම්පාර |
| | | **iii.** පානම රාගම්වෙල හිතටගාම ඉඩම් නිරවුල් කර පදිංචියට හා වගා කිරීමට බෙදා දීම. (ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. . ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)<br>ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීමට තීරණය විය | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, අම්පාර / ප්‍රාදේශිය ලේකම් - ලාහුගල |
| | | **iv.** පානම ශාස්ත්‍රවෙල කට්ටි කර ඇති ඉඩම් නිරවුල් කර දීම. (ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)<br>අනෙකුත් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සමගම මේ පිළබඳවද සොයා බැලීමට තීරණය විය | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, අම්පාර ප්‍රාදේශිය ලේකම් - ලාහුගල |

| | | | |
|---|---|---|---|
| | | **v. පානම මහයාය අලි වැට සංශෝධනය කිරීම.**<br>**(ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)**<br>අනෙකුත් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සමගම මේ පිළබඳවද සොයා බැලීමට නිරණය විය. දෙසැම්බර 21 වන දින සාකච්ඡා කිරීමට නියමිත බව දැනුවත් කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ, වනජීවි දෙපාර්තමේන්තුව, අම්පාර |
| 02 | ලාහුගල | **vi. නිලගිරි මාර්ගයේ හැඩඹය පාලම ප්‍රතිසංස්කරණය කිරීම.**<br>**(ප්‍රාදේශිය ලේකම්, ලාහුගල)**<br>මීට අදාළව ඇස්තමේන්තුවක් හා සැලැස්මක් සකස් කර සම්පූර්ණ ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදි. | විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව, අම්පාර |
| | | **vii. ලාහුගල රජයේ ආයතනවල නිලධාරින්ට ප්‍රවාහන පහසුකම් නොමැතිවීම**<br>**(ප්‍රාදේශිය ලේකම්, ලාහුගල)**<br>ලාහුගල සිට පොතුවිල් හරහා කල්මුණ දක්වා ගමන් ගන්නා නිලධාරීන් ගේ ගමන් පහසුවට ප.ව. 4.30 පොතුවිල් සිට මඩකලපු දක්වා ගමන් ආරම්භ කරන බස් රථය ප.ව. 4.15 ට ලාහුගලින් ගමන් ආරම්භ කරන ලෙස කල්මුණ ඩිපෝ අධිකාරි වෙත උපදෙස් දෙන ලද අතර ලාහුගල සිට සියඹලාණ්ඩුව දක්වා ප.ව. 4.15 නිලධාරීන්ගේ පහසුවට බස් රථයක් යොදවන ලෙසට සියඹලාණ්ඩු ඩිපෝ අධිකාරී වෙත දන්වා යැවීමට තීරණය කරන් ලදි. | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි, නැගෙනහිර පළාත, ගමනාගමන මණ්ඩලය, කල්මුණ |
| 03 | පදියතලාව | **i. පදියතලාව ප්‍රාදේශිය සභාවට අයත් ගොඩනැගිල්ලක් හේතුවෙන් පදියතලාව ප්‍රාදේශිය රෝහලේ වැඩිදියුණු කිරීම් කටයුතු සඳහා බාධා පැවතීම.**<br>**(ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, අම්පාර)**<br>එම ගැටළුව විසඳී ඇති බව දැනුවත් විය. | සභාපති - ප්‍රාදේශිය සභාව, පදියතලාව/ පළාත් පාලන සහකාර කොමසාරිස් - අම්පාර / ප්‍රාදේශිය ලේකම් - පදියතලාව/ මහවැලි අධිකාරිය |
| 04 | නාවිදන්වෙලි | **i. අන්නමලේ රෝහල සඳහා ගිලන්රථයක් ලබා ගැනීම.**<br>**(ගරු අම්පාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිනි, දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. ශ්‍රියාණි විජේවික්‍රම මැතිණිය)**<br>මෙය ග්‍රාමීය රෝහලක් බැවින් ගිලන් රථ ලබා දීම සිදු කළ නොහැකි බව පළාත් සෞඛ්‍ය ලේකම් විසින් දැනුවත් කරන ලද අතර 1990 ගිලන් රථ සේවාව දැනට පවතින බැවින් එය උපයෝගී කර ගැනීම සුදුසු බව තීරණය විය. | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - නැගෙනහිර පළාත |
| 05 | උහන | **i. රජගලතැන්න හන්දියේ විදුලි ට්‍රාන්ස්ෆෝමරය පොළොව මට්ටමේ සිට අඩි 04ක් පමණ උසින් සවි කර ඇති බැවින් එය මහජනතාවට අනතුරක් සිදු වීම වැළැක්වීමට ආරක්ෂිත වැටක් ඉදි කිරීම**<br>**(පොලිස් අධිකාරි, අම්පාර)**<br>ප්‍රාදේශිය සභා සභාපති,ප්‍රාදේශිය ලේකම්,පොලීසිය හා විදුලිබල මණ්ඩල ඉංජිනේරු එක්ව වාර්තාවක් සකස් කරන ලෙස දැනුවත් කරන ලෙස දැනුවත් කරන ලද අතර ඉඩමක් ලබා දීමට හැකි බව ප්‍රාදේශිය ලේකම් තුමිය විසින් පවසන ලදි | විදුලි අධිකාරි, ලංකා විදුලි බල මණ්ඩලය |
| 06 | මහඔය | **i. මුන්දෙණිආරු ව්‍යාපෘතියෙන් කිතුල්ල හා රුගම් ජලාශ යාවෙන ආකාරයට යෝජිත බැම්ම ඉදිකිරීම හේතුවෙන් වැම්පිටි ගම ජලයෙන් යටවීම**<br>**( සභාපති, මහඔය ප්‍රාදේශිය සභාව)**<br>අනු කමිටුවක් පත් කර සාකච්ඡා කිරීමට තිරණය විය. | වාරිමාර්ග අධ්‍යක්ෂ , වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| 07 | අම්පාර | i. අම්පාර නගර සීමාව තුළ ඇති ඉඩම් වනජීවි දෙපාර්තමේන්තුවෙන් නිදහස් කර ගැනීම<br>( ගරු දිගාමඩුලු දිස්ත්‍රික් පා.ම. දයා ගමගේ මැතිතුමා)<br>ඉඩම් ප්‍රාදේශීය ලේකම්ට භාරදෙන ලෙස දැනුවත් කළ අතර නාගරික සංවර්ධන අධිකාරිය මගින් වාර්තාව අමාත්‍යාංශයට යැවිය යුතු බව අවධාරණය කරන ලදි. | වනජීවි දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ඉඩම් කොමසාරිස් කාර්යාලය |
| | | ii. අම්පාර වැව රක්ෂිතයේ පිහිටි මහජන උද්‍යානය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා දීම පිළිබඳ සාකච්ඡා කිරීම.<br>(සභාපති, අම්පාර නගර සභාව)<br>මේ සඳහා විසඳුමක් වනජීවී ඇමති තුමන් විසින් ලබා දෙන ලෙස ට ඉල්ලීමක් සිදු කරන ලදි.<br>නගර සංවර්ධන සැලැස්ම ඉදිරි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලදි | අධ්‍යක්ෂ, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, අම්පාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය අම්පාර |
| | | iii. අම්පාර වැවේ මහජන උද්‍යානය අසළින් ආරම්භ කරන ලද පැවිල් බෝට්ටු නවතා තැබීමට 2018.10.10 දින ලිපි අංක වජී/නෑ/3/2/1/2861/2018 දරණ ලිපියෙන් අප හට දැනුම් දී ඇති අතර මෙම ඉඩම් සම්බන්ධ හා වැව සම්බන්ධ දැනට පවතින තත්වය පිළිබඳ සාකච්ඡා කිරීම. (සභාපති, අම්පාර නගර සභාව)<br>නඩුව ඉල්ලා අස්කරගන්නා ලෙස දැනුවත් කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ, වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව/ අධ්‍යක්ෂ, වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | | iv. නාමල්ඔය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් කරංගාව ප්‍රදේශයේ ඉදි කර ඇති ඔක්ස්ෆාම් ගොඩනැගිල්ල පුහුණු මධ්‍යස්ථානයක් හා නවාතැන් පහසුකම් ලබා දෙන ස්ථානයක් ලෙස පවත්වා ගෙන යාම සඳහා සභාවට පවරා ගැනීම.<br>(සභාපති, නාමල්ඔය ප්‍රාදේශිය සභාව)<br>ගොඩනැගිල්ලේ අයිතිය පිළිබඳ සොයා තීරණයක් ගන්නා ලෙස දිසාපති තුමන්ව දැනුවත් කරන ලදි | ප්‍රාදේශිය ලේකම්, අම්පාර. |
| | | v. නාමල්ඔය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පරගහකැලේ සල්ගස් හංදියේ අඹගහවැල්ල හරහා නාමල්ඔය දක්වා ප්‍රධාන මාර්ගය අංක 1/87 දරණ ඉඩම අසල ඇති බොඩගොල්ල ඔයේ ගිනි පෙට්ටි බෝක්කුව නමින් ඇති බෝක්කු 03 ප්‍රතිසංස්කරණය කිරීම. (සභාපති, නාමල්ඔය ප්‍රදේශිය සභාව)<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයිති බැවින් මේ පිළිබඳ සොයා බලන ලෙස වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත පවරන ලදි. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්, ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය, අම්පාර |
| | | vi. ප්‍රාදේශිය සභාව ඉදිරිපිට සල්ගස් හංදියේ සිට යන ප්‍රධාන මාර්ගය වාවින්න බෝධිමළු විහාරය තෙක් සාදා ඇත. එම බෝධිමළු විහාරය අසල සිට ගල්ඔය ගඟ දක්වා මාර්ගයේ ඇති ප්‍රධාන ලොකු පාලම මැදින් දමන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ දමන පාදාගොඩ දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයට මාර්ගය සෑදීම.<br>(සභාපති, නාමල්ඔය ප්‍රදේශිය සභාව)<br>නාමල්ඔය ප්‍රදේශිය සභාවට පාර කැපීමට අනුමැතිය ලබා දුන් ඌනර අනෙක් පසින් පාර කැපිමට ද දමන ප්‍රාදේශිය සභාවට අනුමැතිය ලබා දෙන ලදි. | අධ්‍යක්ෂ, වාරිමාර්ග දෙපාර්තමේන්තුව අම්පාර./ විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය., අම්පාර |
| | | vii. නාමල්ඔය ප්‍රදේශයේ ගොවි ජනතාවට ලබා නොදුන් සේනා දළඹු හානි කිරිමේ වන්දිය ඔවුන් වෙත කඩිනමින් ලබා දීමට කටයුතු කිරීම හාකුඹුරු ඉඩම්වල සහ ගොඩ ඉඩම්වල හානි වූ ගොවිතැන් සඳහා ආධාර ලබා දීමට කටයුතු කිරීම<br>(උප සභාපති, නාමල්ඔය ප්‍රදේශිය සභාව)<br>රු. මිලියන 434 ක් අනුමත වී ඇති අතර ලද සැනින් ලබා දිමට කටයුතු කරන බව දැනුවත් කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ, කෘෂි රක්ෂණ මණ්ඩලය, අම්පාර |

| | | | |
|---|---|---|---|
| 07. | අම්පාර | **viii.** **රෝහල ඉදිරිපිට ඇති රෝහලේ මංසන්ධිය වටරවුමක් ලෙස ඉදි කිරීම.**<br>**(අධ්‍යක්ෂ, මහ රෝහල, අම්පාර)**<br>අනුමත විය | විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය, අම්පාර |
| | | **ix.** **රෝහල ඉදිරිපිට තාප්පයට යාබදව ඇති තාවකාලික කඩ කාමර ඉවත් කිරීම.**<br>**(අධ්‍යක්ෂ, මහ රෝහල, අම්පාර)**<br>දැනට පවතින තාවකාලික කඩ පාරෙන් අනෙක් පසට ගැනීම කටයුතු කරන ලෙස නගර සභාව දැනුවත් කරන ලදි. | සභාපති, නගර සභාව, අම්පාර |
| 08 | අක්කරපත්තු | **i.** **අක්කරපත්තු මහ නගර සභා කලාපයේ කැලි කසල බැහැර කිරීම පිළිබඳ ගැටළුව**<br>**(මහ නගර සභාව, අක්කරපත්තුව)**<br>ගල්ඔය වැව්ලි සමාගමේ සාමාන්‍යාධිකාරී, අක්කරපත්තු මහ නගර සභාවේ සභාපති, අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් එක්ව නීත්ත ඉඩම පිළිබඳව පරීක්ෂා කර බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙද දැනුවත් කරන ලදි. | සහකාර පළාත් පාලන කොමසාරිස්, අම්පාර |
| 09 | දමන | **i.** **දමන ප්‍රාදේශිය සභාව වෙත ඉඩම් පැවරීම.**<br>• හිඟුරාණ නගරයේ දෛනික පොළ කඩ කාමර 07ක් සහිත ඉඩම<br>• හිඟුරාණ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 25ක් සහිත ඉඩම<br>• ග්‍රාම 07 මුවංගල කඩ කාමර 12 ක් සහිත ඉඩම<br>• දමන ප්‍රාදේශිය සභා කාර්යාල ඉඩම<br>• හිඟුරාණ මහජන පුස්තකාලය, කායවර්ධන මධ්‍යස්ථානය හා ආයුර්වේද මධ්‍යස්ථානය යන ගොඩනැගිලි සහිත ඉඩම<br>• හිඟුරාණ සතිපොළ පවත්වාගෙන යන ගොඩනැගිල්ල සහිත ඉඩම සහ හිඟුරාණ ළමා උද්‍යානය සහිත ඉඩම<br>**(සභාපති, දමන ප්‍රාදේශිය සභාව)**<br>අනුමැතියට ඉදිරිපත් කර ඇති බව ප්‍රාදේශිය ලේකම් විසින් පවසන ලදි. | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, අම්පාර. / සහකාර අධ්‍යක්ෂ,ඉඩම් පරිහරණ සැලසුම් - අම්පාර/ ප්‍රාදේශිය ලේකම් - දමන |
| 10 | පොතුවිල් | **i.** **පොතුවිල් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වැලි කඳු අසල පිහිටි මාර්ගයේ පිරී පවතින වැලි ඉවත් කිරීමට අවසර ලබා ගැනීම.**<br>**(සභාපති, පොතුවිල් ප්‍රාදේශිය සභාව)**<br>වැලි මුහුද අයිනට ඉවත් කිරීමට තීරණය විය | සහකාර අධ්‍යක්ෂ, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, |
| | | **ii.** **පොතුවිල් පිහිටි සත්ව ඝාතකාගාරය වෙනත් ස්ථානයක් වෙත රැගෙන යාම සඳහා රජයේ ඉඩමක් ලබාගැනීම.**<br>**(සභාපති, පොතුවිල් ප්‍රාදේශිය සභාව)**<br>ඊළඟ සභාවාරයට ගෙන යන ලදි. | ප්‍රාදේශිය ලේකම්, පොතුවිල් |
| | | **iii.** **පොතුවිල් ප්‍රදේශයේ මහජන ක්‍රීඩාංගණය සඳහා ඉඩමක් ලබා ගැනීම.**<br>**(සභාපති, පොතුවිල් ප්‍රාදේශිය සභාව)**<br>ඊළඟ සභාවාරයට ගෙන යන ලදි. | ප්‍රාදේශිය ලේකම්, පොතුවිල් |
| | වෙනත් යෝජනා | 1.වැලි බලපත්‍ර නිකුත් කිරීමේ දි ඇතිවන අවහිරත් මගහරවා ගැනීම( සභාපති. මහඔය ප්‍රාදේශිය සභාව)<br>ප්‍රාදේශිය සභා සභාපතිතුමාගේ නිර් දේශය නොමැතිව බලපත්‍ර නිකුත් නොකරන ලෙස ඇමතිතුමා විසින් දන්වා සිටි අතර දිස්ත්‍රික් ලේකම්තුමන් ගන්නා ක්‍රියාමාර්ග අනුව ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දෙන ලදි. | සහකාර අධ්‍යක්ෂ, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය |

05. **i. 2019 වසර තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම.**

2019 වර්ෂය සඳහා වැඩසටහන් 22 ක් යටතේ රු මිලියන 3,172,951 ක් වටිනා ව්‍යාපෘති 9634 ක් අනුමත වූ අතර ඉන් රු මිලියන 2,229,553 ක් වියදම් කර ඇත.

## Programs' Summary – Ampara District Secretariat

| | |
|---|---|
| NO. OF DEVELOPMENT PROGRAMS | 22 |
| NO. OF PROJECTS | 9634 |
| APPROVED ALLOCATON | 3,172.951 *Million* |
| COMPLETED PROJECTS | 8105 |
| ON-GOING PROJECTS | 1417 |
| PROJECTS UNDER INITIAL STAGE | 112 |
| TOTAL EXPENDITURE | 2,229.553 *Million* |

## Progress Reported for the Development Programmes – 2019 District Secretariat - Ampara

| Sl. No | Program | No of Projects | Physical Progress | | | Financial Progress | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | Initial Stage | ON-Going | Completed | Approved Allocation (Rs/MN) | Expenditure (Rs/MN) | Liabilities (Rs/MN) |
| 01 | Gamperaliya | 5908 | 22 | 367 | 5,519 | 1,723.600 | 1,615.037 | 0.841 |
| 02 | RIDP I | 179 | 20 | 50 | 109 | 385.905 | 85.313 | 33.60 |
| 03 | RIDP II | 69 | 22 | 40 | 7 | 34.500 | 0.984 | 0.494 |
| 04 | DCB 2019 | 1095 | | 280 | 815 | 92.859 | 54.531 | |
| 05 | National Programs under Presidential Secretariat | 163 | 0 | 26 | 137 | 112.128 | 53.585 | 16.2 |
| 06 | Gramashakthi 2018/2019 | 1063 | | 350 | 713 | 132.000 | 44.559 | |
| 07 | Resettlement | 568 | 0 | 51 | 517 | 315.765 | 252.834 | 2.164 |
| 08 | Task Force on Resettlement | 141 | 22 | 77 | 42 | 97.408 | 9.413 | 8.883 |
| 09 | ONUR | 124 | 2 | 72 | 50 | 101.180 | 26.580 | [illegible] |
| 10 | Sukhitha Purawara | 24 | | 8 | 16 | 29.688 | 18.235 | |
| 11 | Development of Kandyan Heritage | 43 | 1 | 12 | 30 | 18.930 | 7.265 | |

# Progress Reported for the Development Programmes – 2019
## District Secretariat - Ampara

| SL No | Program | No of Projects | Physical Progress | | | Financial Progress | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | Initial Stage | ON-Going | Completed | Approved Allocation (Rs/MN) | Expenditure (Rs/MN) | Liabilities (Rs/MN) |
| 12 | Religious Places | 64 | 0 | 12 | 52 | 27.010 | 17.736 | |
| 13 | Rural Playground | 5 | 0 | 1 | 4 | 7.392 | 4.063 | - |
| 14 | Tourism | 2 | - | 1 | 1 | 12.330 | 3.420 | |
| 15 | REEP | 9 | - | 2 | 7 | 50.505 | 30.559 | 1.2[illegible] |
| 16 | City Planning | 149 | 19 | 63 | 67 | 3.725 | 1.430 | 0.2[illegible] |
| 17 | Computer Lab Programme -2019 | 2 | | - | 2 | 0.416 | 0.412 | - |
| 18 | Diyawarphyasa Housing Program | 16 | | 4 | 12 | 1.600 | 0.380 | |
| 19 | Programme under the Ministry of Industries & Commerce | 2 | | | 2 | 3.557 | 2.867 | - |
| 20 | Regional Development Project | 4 | 0 | 1 | 3 | 7.851 | 0.330 | - |
| 21 | Lagoon Conservation Program | 2 | 2 | - | - | 6.500 | - | - |
| 22 | Rural Bridge Dev. Program | 2 | 2 | - | | 8.020 | - | - |
| | TOTAL | 9634 | 112 | 1417 | 8105 | 3172.951 | 2229.553 | 74.817 |

ii. 2019 වසර තුළ අම්පාර දිස්ත්‍රික්කයේ අනෙකුත් දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳව ඉදිරිපත් කිරීම

- ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය - සහකාර අධ්‍යක්ෂ,අම්පාර

# Flood Disaster Situation

| NO | Administrative system | | [illegible] Disaster | Date of commenced | Affected | | Deaths | Houses Damaged | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | District | Divisional Secretary Division | | | Families | Persons | | Fully | Partially |
| 1 | Ampara | Kalmunai TD | Floods | 25.11.2019 | 609 | 2131 | 0 | 0 | 0 |
| 2 | | Sainthamaruthu | | | 308 | 378 | 0 | 0 | 6 |
| 3 | | Karaitivu | | | 825 | 3250 | 0 | 1 | 42 |
| 4 | | Ninthavur | | | 550 | 2205 | 0 | 0 | 0 |
| 5 | | Addalachchenai | | | 810 | 2835 | 0 | 0 | 1 |
| 6 | | Akkaraipattu | | | 663 | 2250 | 0 | 0 | 1 |
| 7 | | Alayadivembu | | | 1120 | 3920 | 0 | 0 | 0 |
| 8 | | Thirukkovil | | | 1109 | 3880 | 0 | 1 | 26 |
| 9 | | Pottuvil | | | 876 | 3064 | 0 | 0 | 0 |
| 10 | | Sammanthurai | | | 9 | 42 | 1 | 0 | 2 |
| 11 | | Uhana | | | 48 | 163 | 0 | 0 | 4 |
| 12 | | Ampara | | | 20 | 78 | 0 | 0 | 20 |
| 13 | | Damana | | | 2 | 11 | 0 | 0 | 2 |
| 14 | | Lahugala | | | 246 | 840 | 0 | 0 | 3 |
| | Total | | | | 7147 | 25027 | 1 | 2 | 127 |

07. ස්තුති කථාව

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ කටයුතු සාර්ථක කර ගැනීම වෙනුවෙන් කමිටුවට සහභාගී වී සිටි සභාපතිතුමියටත්, ගරු ඇමතිතුමන්ටත්, , මන්ත්‍රීවරුන් සහ සියළුම රජයේ නිලධාරීන්ටත්, පොලිස් නිලධාරීන් ,රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින්ටත් ,මාධ්‍යවේදීන්ටත්, අම්පාර දිස්ත්‍රික් ලේකම් ඩී.එම්.එල්.බණ්ඩාරනායක මහතා විසින් තම ස්තුතිය පළකර සිටීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ප.ව. 2.00 ට පමණ අවසන් විය

ඩී.එම්.එල්.බණ්ඩාරනායක,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,
අම්පාර

ඩී.එම්.එල්. බණ්ඩාරනායක
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර